(c) www.sinhalalyrics.com

හන්තාන අඩවියේ මැදුරු කුළුණු සුදු සඳළු තලා පිස
මේ එන්නේ ප්‍රේමයේ සුවඳ නොවේ
හන්තාන අඩවියේ පුසුඹ වදුලු තුරු සිරස හමාගෙන
මේ එන්නේ ප්‍රේමයේ සුවඳ නොවේ

කුසින් අඩක් දළ අඟරින් සකසා
කෙසඟ සිරුරු රළු යහනේ සතපා
අනියත හෙට ගැන සිතමින්
විද්‍යා ශිල්ප කලා වනපොත් කරනා
මානව මානවිකාවන්ගේ
නලියන රුදිරෙ උණුසුම් සුසුමයි

පීඩනයෙන් පැණ සර හිස ඔසවා
පෙරමුණ ගත් වරදට වෙඩිසැර කා
මළ සොයුරන් සිහිකරමින්
විද්‍යා ශිල්ප කලා වනපොත් කරනා
මානව මානවිකාවන්ගේ
පුපුරණ මනසේ කකියන පැතුමයි

පද රචනය - සුනිල් ආරියරත්න
සංගීතය - මර්වින් පෙරේරා

(c) www.sinhalalyrics.com